ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2006/2007

පවුල් නීතිය - LWU 2313

කාලය - විනාඩි හතළිහයි.

---

දිනය - 2006.11.07 වේලාව - ප.ව.03.00- ප.ව.03.40 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*
*<u>එක් ප්‍රශ්නයකට</u> පමණක් පිළිතුරු සපයන්න.*

01. රන්ජන් වඩු කාර්මිකයෙකි. ඔහු රජයේ විදුහලක උපාධිධාරී ගුරුවරියක වූ විජිතා සමග සාමාන්‍ය නීතිය යටතේ විවාහ වී සිටී. දෙදෙනාම තමන්ට අයත් නිවසක ජීවත් වූහ. ඔවුනට කමල් හා සංඛ නමින් පුතුන් දෙදෙනෙක් වෙති. 2000 වර්ෂයේ දී රන්ජන් වැලිඔය කාන්තාවක් සමග සබඳතාවක් ඇති කර ගෙන විජිතා හා දරුවන් අත්හැර දැම්මේය. ඔවුනට මුදල් එවීම ද ඔහු විසින් ප්‍රතික්ෂේප කරන ලදී. රන්ජන්ට එරෙහිව නඩත්තු නඩුවක් පවරා තමා සහ කාර්මික විද්‍යාලයේ අධ්‍යාපනය ලබන 21 හැවිරිදි කමල් හා නුගේගොඩ ජාත්‍යන්තර පාසලක අධ්‍යාපනය ලබන 14 වියැති සංඛ වෙනුවෙන් නඩත්තු ඉල්ලීමට විජිතා තීරණය කළාය.

(අ) 1999 අංක 37 දරණ නඩත්තු පණත,
(ආ) 1889 අංක 19 දරණ නඩත්තු ආඥා පණත,
(ඇ) මුස්ලිම් නීතිය,

යටතේ සියළු පාර්ශ්වයන්ගේ වගකීම් සහ අයිතිවාසිකම් සාකච්ඡා කරන්න.

02. "කිසියම් ලිපියක අඩංගු භාෂාවෙන් විවාහ වීම සඳහා පොරොන්දුවක් ඉස්මතු කර ගත හැකි වන්නේ නම් විවාහ පොරොන්දු කඩ කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා එම ලිපිය පදනම් කර ගත හැකිය."

විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් මෙම ප්‍රකාශය විවේචනාත්මකව විභාග කරන්න.

- හිමිකම් ඇවිරිණි. -